## නීතිපතිතුමනි,

## නේවි නඩුවේ 14වන චූදිතයා වසන්ත කරන්නාගොඩ නිදහස් කරන්න හදන්නේ ඇයි? නඩුවේ චෝදනා 667ක් තිබිලත්, සාක්ෂිකරුවන් 200ක් ඉදලත් කරන්නාගොඩට එරෙහිව සාක්ෂි නෑ කියන්නද හදන්නේ?

1) 2008 - 2009 කාල වකවනුවේ තරුණ දරුවන් ඇතුළුව පුද්ගලයින් 11 දෙනෙකු කප්පම් ලබා ගැනීම සඳහා පැහැරගෙන ගොස් අතුරුදහන්කොට, ඝාතනය කිරීම සම්බන්ධව මූලික විමර්ශණයක් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ B 732/2009 දරණ නඩුකරය යටතේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශණ සිදු කරීමෙන්, වසර 13කට පසුව එකී චෝදනාවන් සමබන්ධව සැකකරුවන් 14 දෙනෙකුට එරෙහිට එවක ගුරු නීතිපතිතුමා විසින් අධිචෝදනා ගොනු කිරීමෙන් පසු ගරු අගවිනිසුරුතුමන්ගේ අධීක්ෂණය යටතේ මෙම නඩුකරය විභාග කිරීම සඳහා විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණයක් නම් කරන ලදි.

2) එකී ත්‍රිපුද්ගල මහාධිකරණ ඉදිරියේ චූදිතයින් 14 දෙනෙකුට 2020.01.03 වන දින අධිචෝදනා තනා ඇති අතර එහි 14වන චූදියා වන හිටපු නාවික හමුදාපතිවරයෙකු වන වසන්ත කරන්නාගොඩ යන අය ඉත අධිචෝදනාවට එරෙහිව 2020.03.12 වන දින CA (writ) 77/2020 යන නඩුකරයේ ගරු අභියාචනාධිකරණයේ පවරනු ලැබ ඇත. අනතුරුව ඒ සම්බන්ධයෙන් අගතියට පත් අතුරුදහන් දරුවන්ගේ දෙමාපියන් විසින් මැදිහත් පාර්ශවයක් ලෙස එකී නඩුකරයට 2020.10.13 වන දින ඇතුළත් වී ඇත.

3) වසර 11ක් විමර්ශන සඳහා උපදෙස් ලබාදුන් හා විමර්ශන සම්බන්ධයෙන් පූර්ණ අධීක්ෂණය කරන ලද එකම පුද්ගලයාවූ නීතිපති දෙපාර්තමේන්තුව ත්‍රිපුද්ගල මහාධිකරණයේ 14වන චූදිතයා වූ වසන්ත කරන්නාගොඩට අධිචෝදනා ගොනුකොට, ඔහු විසින් ඊට එරෙහිව ගිය අභියාචනාධිකරණයේ පෙත්සමේදී ඒ සම්බන්ධයෙන් වසන්ත කරන්නාගොඩගේ පෙත්සමට මුල් අවස්ථාවේ දැඩිව විරෝධතාවයද දක්වා, මාහාධිකරණයේ පවා ඔහුට එරෙහිව කරුණු ඉදිරිපත් කරමින් සිට, එක වරටම 2021දී නව නීතිපතිවරයා වූ සංජය රාජරත්නම් නීතිපතිවරයා විසින් එම ස්ථාවරය වෙනස් කරගන්නේ අරුම පුදුම් ලෙස පමණක් නොව ස්වභාවික යුක්ති මූලධර්මයන්ට හා නීතියේ අධිපත්‍යයේ පදනම වූ යුක්තියට පයින් පහරක් ගැසුවාක් මෙන් අගතියට හා වින්දිතභාවයට පත්වූ දෙමාපියන්ට පයින් පහරක් ගසමිනි. එබැවින් අප නීතිපතිවරයාගෙන් අගතියට පත් දෙමාපියන් ලෙස මෙසේ ප්‍රශ්නකර සිටිමු. එසේම මේ රටේ පුරවැසියන්ගෙන්ද, වගකිවයුතු සියලුම බලධාරින්ගෙන්ද, ගරු අධිකරණයේද අපගේ යුක්තිය ඉටුවීම සම්බන්ධයෙන් ප්‍රශ්නකර සිටිමු.

4) ඉහත සිදුවීම සම්බන්ධයෙන් 2009.05.28 වන දින මුල් නඩුවේ චූදිතයෙකු වන සම්පත් මුණසිංහ යන අය ත්‍රස්තවාදී ක්‍රියාවලට සම්බන්ධ බවට සඳහන් කරමින් මුල් පැමිණිල්ලක් කොළඹ අපරාධ කොට්ඨාසයටත් සිදුකර තිබුණේ ඉහත කී 14 වන චූදිතයා වන වසත්ත කරන්නාගොඩ යන අය විසිනි. එහෙත් එකී පැමිණිල්ල තුළ කිසිදු ආකාරයකට ඉහත කී දරුවන් අතුරුදහන් කිරීමක් හෝ පැහැරගෙන යාමක් හෝ වෙනයම් ආකාරයේ ඝාතනය කිරීමක් සම්බන්ධව කිසිදු කරුණක් එකී පැමිණිල්ලේ ඔහු විසින් ඇතුළත් කොට තිබුණේ නැත. එහෙත් මෙම නඩුවේ පවතින සාක්ෂි ගණනාවක් තුළින් ඉහත කී 14 වන සැකකරු එම දරුවන් පැහැරගෙන යාම, අතුරුදහන් කිරීම, නිති විරෝධී ලෙස රඳවා තබා ගැනීම, අවසානයේදී ඝාතනය කිරීම සිදු කිරීම සම්බන්ධයෙන් දැන සිටි බවට කරුණු ඉදිරිපත්කොට ඇත.

5) එසේම ඉහත කී 14 වන චූදිතයා එකී සියළු කරුණු දැන සිටියදී හා නාවික හමුදාපතිවරයා වශයෙන් සියළු බලතල තිබියදී එකී අපරාධය වැළැක්වීමට හෝ එකී අපරාධකරුවන් සම්බන්ධට අනාවරණය කිරීමට හෝ අපරාධකරුවන්ගේ එකී ක්‍රියාව සම්බන්ධව නිතිමය පියවර ගැනීමට හෝ, ඒ සඳහා උත්සහයක් හෝ දරා නොමැත.

6) මෙම නඩුවේ ප්‍රධාන සාක්ෂිකරුවකු වන එවක කපිතන්වරයෙකු වූ සහ වර්තමානයේ රියර් අද්මිරාල් ආනන්ද ගුරුගේ යන අය විසින් සිය ප්‍රකාශයන්වලදී ලබාදී ඇත්තේ ඉහත කී 14 වන චූදිතයා විසින් 2009.05.28 වන දින පැමිණිල්ල සිදුකිරීමට ප්‍රථමව ඉහතකි සම්පත් මුණසිංහ ඇතුළු සියළු සැතකරුවන්ගේ ක්‍රියාදාමයන් දැනසිටි බවයි. එනම් 2009.05.26 වන දින වන විටත් නාවික සෙබළුන් හරහා මෙම සිද්ධිය සම්බන්ධයෙන් සොයා බලන ලෙස තමාහට 14 වන චූදිතයා කියාසිටි බවත්, ඒ අනුව උපුල් බණ්ඩාර ලක්ෂමන් හා චන්ද්‍රකාන්ත යන අය මඟින් ප්‍රශ්ණකොට, වෙළගෙදර යන නිළධාරියා මඟින් ත්‍රිකුණාමල ගන්සයිඩ් භූගත ස්ථානයේ මෙකි දරුවන් සම්බන්ධව විමසීමක් කොට තිබූ බවත්, එහිදි එකී ගන්සයිඩ් භූගත ස්ථානයේ දරුවන් රඳවා සිටිබව සහ දරුවන් පැහැර ගෙන ගොස්, එසේ රඳවා සිට ඝාතනයට ලක්කළ බවත් එමගින් දැනගෙන ඇති බවයි. එම සියළු කරුණු ඔහු විසින් 14 වන චූදිතයා වන ඉහත කී වසන්ත කරන්නාගොඩ වෙත දැනුවත්කොට ඇති බවත්, ඔහුගේ ප්‍රකාශයේදී සාක්ෂි ලබාදී ඇත.

7) තවද මෙම අතුරුදහන් කළ දරුවන්ගේ එක් මවක වන සරෝජිනි නාගනාදන් යන අයගේ සහෝදරයෙකු වූ රාවන් ප්‍රභාකරන් විසින්, සින්නා යන ඔහුගේ මිත්‍රයෙකු මගින් එවක සපුගස්කන්ද ත්‍රිවිධ හමුදා පීඨයේ අණදෙන නිළධාරීව සිටි ජගත් ජයන්ත රණසිංහ වෙත මෙම දරුවන් පැහැරගෙන යාම සම්බන්ධයෙන් හා එකී පැහැරගැනීමට ලක්වූ රජීව් නාගනාදන් යන අය දුරකථනයෙන් කථාකළ බවත් දැනුම්දී ඇති බවයි.

8) පසුව ඉහත කී ආනන්ද ගුරුගේ හරහා ඒ සම්බන්ධයෙන් තොරතුරු ලබාගත් බවයි. තවද ඉහත කී 2009.05.28 වන දින පැමිණිල්ල සිදු කිරීමට ප්‍රථමව යුධ හමුදා පොලිසිය භාරව සිටි කපිතන් සෙනර හංවැල්ල මඟින් සම්පත් මුණසිංහගේ නිළධාරී කාමර අංක 08 පරීක්ෂාකර, කස්තුරි ආරච්චිගේ ඇන්තනි, අමලන් ලියොන්, රොෂාන් ලියෝන්, ත්‍යාගරාජා ජෙගන් යන අයගේ ජාතික හැඳුනුම්පත සහ විදෙස් ගමන් බලපත්‍රයද, ප්‍රොමිසරි නෝට්ටු, ජීව උණ්ඩ 454 ක් හා දුරකථන සොයා ගැනීමට ලැබුණු බවත් ඒ සම්බන්ධව 14 වන චුදිත වෙත දැනුම්දුන් බවත් දක්වා ඇත.

9) මෙම සියළු කරුණු මහේස්ත්‍රාත් අධිකරණයේ B 732/19 නඩුකරයට ගොනුකොට ඇති වැඩිදුර විමර්ෂණ වාර්තා මගින් දක්වා ඇත. තවද එවක නාවික හමුදාවේ ප්‍රධාන නීති උපදේශක ලෙස සිටි නීතිඥ ශවේන්ද්‍ර ප්‍රනාන්දු මහතා ඉහත නඩුකරය සම්බන්ධව සැකකරුවෙකු වශයෙන් අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු විසින් ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත පැමිණ සඳහන් කරන ලද්දේ තමා විසින් මෙකී අපරාධයට සම්බන්ධ සැකකරුවන් ගැන නාවික හමුදාපතිවරයාව දැනුවත් කළ බවත්, එය ඔහුගේ සීමාවේ කළ හැකි ක්‍රියාව වූ බවයි. තවද ඔහු විසින් ලබාදී ඇති ප්‍රකාශය, 2009.05.27 වන දින තමා ඒ සම්බන්ධව නාවික හමුදාපතිවරයා වූ වසන්ත කරන්නාගොඩ වෙත දැනුවත් කළ බව සඳහන් වේ.

10) තවද 2009.05.28 දිනට ප්‍රථම එවක නැගෙනහිර ආඥාපතිව සිටි රියර් අද්මිරාල් තුසිත් වීරසේකර මගින් ත්‍රිකුණාමල ගන්සයිඩ් භූගත ස්ථානයේ මෙම දරුවන් සිටිනවාද යන්න සම්බන්ධයෙන් වීමසීමේදී ඒ

සම්බන්ධව සියළු විස්තර 14 වන චූදිත වෙත ඔහු විසින් ලබාදී ඇතිබව ඔහුගේ ප්‍රකාශයන්හිදී සඳහන් කොට ඇත.

11) තවද නාවික හමුදාපතිවරයෙකු සිටි එවක ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ නාවික සමුද්‍ර තටාංගනය භාරව සිටි අණදෙන නිලධාරි ටැවින් සින්නයියා (නැගෙනහිර නාවික විධානයේ ආඥාධිපති) යන අය විසින් සිය ප්‍රකාශයේදී ලබාදී ඇත්තේ මෙම අපරාධය සිදුවන අවස්ථාවන් වන විටත් මෙකී නීති විරෝධී ගන්සයිඩ් භූගත ස්ථානය සම්බන්ධව 14 වන චූදිතයා වන වසන්ත කරන්නාගොඩ දැන සිටි බවයි. ප්‍රධාන සැකකරුවන් සම්බන්ධයෙන් හා ඔවුන් විසින් මෙකී දොරටුවෙන් එහා මෙහා යාම සම්බන්ධට සැකයක් ඇතිවූ බැවින් ඒ සම්බන්ධව 14 වන චූදිතයා වෙත එවක දැනුම් දුන් නමුත් 14 වන චූදිතයා වන වසන්ත කරන්නාගොඩ ඒ සම්බන්ධව සොයා බැලීම අනවශ්‍ය බවට තමාට දැනුම් දුන් බව සඳහන්කර ඇත.

12) තවද එවක ධීවර ආමාත්‍යවරයාව සිටි ෆිලික්ස් පෙරේරා යන අයට මෙම සිදුවීමේදී අතුරුදහන් කිරීමට ලක්වූ රජීව් නාගනාදන් යන අයගේ මව වන සරෝජනි නාගනාදන් යන අය ඔහු අසල සිටියදී දුරකථනයෙන් කථා කළ බවත්, එහිදී එම රජීව් නාගනාදන් ලබාදුන් තොරතුරු අනුව නාවික හමුදාපතිව සිටි 14 වන චූදිතයාගේ සහකාර ලේකම් ශ්‍යාමාල් ප්‍රනාන්දු යන අයට මෙම දරුවන් සම්බන්ධව සොයා බැලීමට තමා කිවූ බව මෙම නඩුවේ සාක්ෂිකරුවෙකු වන ෆිලික්ස් පෙරේරා යන අය මඟින් ප්‍රකාශ ලබාදී ඇත. මෙම ස්ථානයේ එම දරුවා කථා කරන විට ජා-ඇල ප්‍රදේශීය සභාවේ සභාපති ප්‍රනාන්දු නැමැති තැනැත්තාද සිට ඇති අතර ඔහුගේද සාක්ෂි සටහන්කොට ඇත.

13) තවද ඉහත ශ්‍යාමාල් ප්‍රනාන්දු යන අය මේ සම්බන්ධයෙන් 14 වනචූදිතයා වන වසන්ත කරත්තාගොඩ යන අයට දැනුම්දී ඇතිබව සඳහන් වේ. තවද ඉහත කී ෆිලික්ස් පෙරේරා යන සාක්ෂිකරු විසින් මෙම දරුවන් නාවික හමුදා භාරයේ සිටින බව සහ ඔවුන් නිදහස්කර දෙන ලෙසට 14 වන චූදිතයා වන වසන්ත කරන්නාගොඩ වෙත මුද්‍රිත ලිපියක් මඟින් එවක දන්වා ඇත. තවද මෙම අතුරුදහන්කිරීමට ලක්වූ රජීව් නාගනාදන් යන අයගේ මව වන සරෝජිනී තාගනාදන් යන අය විසින් 2009.05.21 වන දින අවසන් වරට රජීව් නාගනාදන් තමා වෙත දුරකථනයෙන් කථාකළ බව ප්‍රකාශකොට ඇත.

14) තවද මෙකී දුරකථන තොරතුරු, දුරකථන විශ්ලේෂණ වාර්තා මඟින් අනාවරණය කොටගෙන ඇති බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට ගොනුකළ වැඩිදුර වාර්තාවල සඳහන් වේ. තවද මෙම සියළු සිදුවීම සහ ප්‍රකාශ වැඩිදුර වාර්තා මඟින් ඉදිරිපත්කොට ඇති සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පිණ්ඩන වාර්තා මඟින් එකී සාක්ෂි සම්බන්ධව ගැලපී ඇත. තවද බන්දු කුමාර, වෙළගෙදර යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුවද මෙම අතුරුදහන්කිරීමට ලක්වූ තැනැත්තත් 2009.05.24 හෝ ඊට ආසන්න දිනයක් දක්වා මෙම ගන්සයිඩ් භූගත කඳවුරේ ජීවතුන් අතර සිටි බවට කරුණු හෙළිදරවු වේ.

15) එහෙත් 14 වන චූදිතයා විසින් වගකිව යුතු නාවික හමුදාපතිවරයෙකුව සිටියදී එකී තොරතුරු දැන සිටියදීත් එකී නීතිවිරෝධී ක්‍රියාව මැඩ පැවැත්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. මේ සම්බන්ධව තහවුරු කිරීමට නාවික නිළධාරී වෙළගෙදර, බන්දු කුමාර සහ කීර්ති විජය බණ්ඩාර යන අය විසින්ද සාක්ෂි ලබාදී ඇත.

16) ඉහත සියළු තොරතුරු සහ සාක්ෂි අනුව 14 වන චූදිතයා 2009.05.28 වන දින සම්පත් මුණසිංහ යන අය සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාශයට පැමිණිලි කරන විටත් මේ සම්බන්ධයෙන් සියළු විස්තර හා දරුවන් සම්බන්ධයෙන් තොරතුරු දැන සිට ඇති නමුත් එකී සියළු තොරතුරු වසංකොට සඟවා කටයුතු කර ඇතිබව පැහැදිලිව පෙනෙයි.

17) තවද මෙවැනි අපරාධයක් සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාශයට පවතින බලය සීමිත යැයි වගකිව යුතු නිළධාරියෙකු ලෙස 14 වන චූදිතයා දැන සිටියදීත් එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමකින් තොරව කොළඹ අපරාධ කොට්ඨාශය වෙත ලබාදී තිබීමත්, තවද මෙම අපරාධයට සමබන්ධ සියළු පුද්ගලයින් මෙකී පැමිණිල්ල සිදුකරන අවස්ථාවේදී 14 වන චූදිතයා වන වසත්ත කරත්තාගොඩ යන අය දැනසිටි නමුත් එකී සියළු සැකකරුවන් සම්බන්ධයෙන් කිසිදු කරුණක් අනාවරණය කිරීමක් නොකොට පුද්ගලිකව එක් අපරාධකරුවෙකු පමණක් ඉලක්කකොට මෙකී පැමිණිල්ල සිදුකර ඇත.

18) තවද මේ සම්බන්ධයෙන් රියර් අද්මිරාල් ආනන්ද ගුරුගේ විසින් මෙයට චන්දන ප්‍රසාද් හෙට්ටිආරච්චි යන අය සම්බන්ධ බැවින් ඔහු සම්බන්ධව කුමක් කරන්නේද යන්න වසන්ත කරන්නාගොඩගෙන් විමසන අවස්ථාවේදී ඔහු කඳවුරෙන් පිට නොයන අයෙකු බැවින් ඔහු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු නොවන බව දක්වා ඇති බවට ප්‍රකාශ ලබාදී ඇත.

19) ඒ අනුව, මෙම සියළු සාක්ෂි හා කරුණු අනුව 14 වන චූදිතයාට ගොනුකොට ඇති අධිචෝදනා පත්‍ර වසර 11ක විමර්ශණ වලින් පසු එකී සාක්ෂි විශ්ලේෂණය කොට ගරු පූර්වගාමී නීතිපතිවරයා විසින් ඒ සම්බන්ධව සෑහීමකට පත්වීමෙන් පසුව ගොනු කරනු ලැබූ අධිචෝදනා පත්‍රයක් බව අගතියටපත් පාර්ශවයේ ස්ථාවරයයි.

20) තවද 14 වන චූදිතයා විසින් ඉහත සාක්ෂිකරුවන් ඔහුට විරුද්ධව සාක්ෂි ලබාදීමට හේතුව ලෙස යම් ආකාරයකින් එම සාක්ෂිකරුවන් ඔහු සමග පැවැති පුද්ගලික අමනාපකම් සහ ආරවුල් හේතුවූ බවට කියා සිටින්නේ නම් එය කිසිදු අධිකරණයක් ඉදිරියේ ඔහු විසින් ඔප්පු කොට නොමැති හුදු ප්‍රලාප පමණක් වේ. එබැවින් 14 වන චූදිතයාගේ එකී ස්ථාවර කිසිසේත් මෙවැනි අවස්ථාවක සලකා බැලීමට හැකියාවක් නොමැති අතර එය ඔහු විසින් සාධාරණ නඩු විභාගයකදී සිය සාක්ෂි මඟින් ඔප්පු කළ යුතු කරුණු වේ.

21) වසර 11ක කාලයක් පුරා කරන ලද පූර්ණ විමර්ශණවලින් පසුව 14 වන චූදිතයා සහ සෙසු චූදිතයන් වෙත අධිචෝදනා පත්‍ර ගොනුකොට තිබියදී 14 වන චූදිතයා විසින් ඉදිරිපත් කරනු ලබන එවැනි කිසිදු ආකාරයේ කරුණු දැක්වීමක් වේ නම් ඒ සියළු කරුණු පදනම් විරහිත වේ. තවද මහේස්ත්‍රාත් අධිකරණය විසින් 14වන චූදිතයා වන වසන්ත කරන්නගොඩ අත්අඩංගුවට ගැනීමට පූර්ව නියෝග ලබාදී තිබියදී එකී නියෝගය මහහරිමින් චූදිතයා ක්‍රියාකොට, පසුව එය සම්බන්ධයෙන් අධිකරණ සහන අයැද ඇත.

22) එහිදී ඔහු විසින් අධිචෝදනා පත්‍රය ගොනු කිරිමට පූර්ව අවස්ථාවේදි ගොනු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගනුලැබූ අවස්ථාවේ ඔහු වෙත ගරු අධිකරණය විසින් ලබාදුන් නියෝගය වන්නේ ඔහු ඒ අවස්ථාවේ අත්අඩංගුවට ගැනීමක් සිදු නොකොට, නමුත් ඔහුට එරෙහිව සම්පූර්ණ විමර්ශණයක් සිදුකොට ඔහුට එරෙහිව පියවර ගැනීමට නීතිපතිවරයාට බලය ඇති බවයි. එසේම ඔහුට විදේශගත වන්නේ නම් ඒ සඳහා ඔහුගේ දිවුරුම් ප්‍රකාශය අනුවම අධිකරණයේ අවසර ලබාගෙන එසේ විදේශගත වියයුතු බවත්

සාක්ෂිකරුවන්ට බලපෑම් නොකළ යුතු බවත් නියමකර ඇත. එම අවස්ථාවේ අත් අඩංගුවට ගැනීමක් නොකොට අතුරු තහනමක් ලබාදීමෙන් ඔහු නිදහස් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය අදහස් නොකරන ලද බැලූ බැල්මට පෙනේ. ඔහුට එම අවස්ථාවේ එම අතුරු තහනම ලබාදෙනු ලැබුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් ප්‍රකාශයක් ලබාදෙන ලෙසත්, ඉහත සඳහන් කරනලද ආකාරයෙන් අධිකරණයේ අවසරයකින් තොරව විදේශගත නොවන ලෙසත් අධිකරණය මගහැර ක්‍රියා නොකරන ලෙසත් සහ සාක්ෂිකරුවන්ට බලපෑම් නොකිරීමේ කොන්දේසිය මත බැඳ තබමින්ය. වසන්ත කරන්නාගොඩට එරෙහිව සාක්ෂි නොතිබුනේ නම් ඉන් අනතුරුව නීතිපති දෙපාර්තමේන්තුව ඔහුට එරෙහිව අධිචෝදනා නැගීමට නොපෙළඹෙනු ඇත.

23) ඒ පරිදි සියළු විමර්ශණ ඔහු සම්බන්ධයෙන් අවසන්කොට ඔහුට එරෙහිව පැවති හා ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේදී මුල් අවස්ථාවේ ඉදිරිපත් කළ කරුණුද නීතිපතිවරයා සලකා බලමින් අධිචෝදනා පත්‍රය අනිවාර්යයෙන් ගොනුකොට ඇත. එවැනි අවස්ථාවකදී එකී අධිචෝදනා පත්‍රය ගරු මහාධිකරණයෙන් ඔහු වෙත ලබාදීමට නියෝගකොට තිබියදී බොහෝ කාලයක් එකී අධිචෝදනා පත්‍රය භාර ගැනීමකින් තොරව එය මගහැර ක්‍රියාකොට, ගරු අභියාචනාධිකරණය වෙත එකී අධිචෝදනා පත්‍රය තමාට භාර නොදෙන ලෙසට පෙත්සමක් 2020 වර්ෂයේ ඉදිරිපත්කොට ඇත.

24) කෙසේ නමුත් මෙකී නඩුවට අදාළ වන්නේ ඉතා බරපතල මෙන්ම සාහසික මනුෂ්‍ය ඝාතන හා ඊට අදාළ අනුබල දීමය. එවැනි තත්වයකදී සාධාරණ නඩු විභාගයකදී තමාගේ චෝදනා සම්බන්ධයෙන් සාක්ෂි මගින් තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීම සඳහා ප්‍රමාණවත් අවස්ථා තිබියදී එසේ ඔහුට එරෙහිව නගා ඇති අධිචෝදනාව සම්බන්ධව තහවුරු කිරීම සඳහා සාක්ෂිකරුවන් සිටියදී ඔහුගේ අධිචෝදනා පත්‍රය ඉවත්කරවා ගැනීමට 14 වන වූදිතයා විසින් කරනු ලබන උත්සහය සඳහා නීතිපතිවරයා අත එසවීම කිසිසේත්ම ස්වභාවික යුක්ති මූලධර්මයන්ට අනුකූළ නොවන බව අගතියට පත් පාර්ශවයේ ස්ථාවරය වේ.

25) මෙම වූදිතයා විසින් 2020.01.03 වන දින අධිචෝදනා පත්‍රය ගරු ත්‍රිපුද්ගල මහාධිකරණයේ ගොනු කිරීමෙන් පසු 2020.01.23 වන දින 2015.01.08 වන දිනෙන් ආරම්භ වී 2019.11.16 වන දිනෙන් අවසන්වූ කාල සීමාව තුළ සිදුවී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳව පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති කොමිෂන් සභාව වෙත පැමිණිලි අංක 01/2020 යටතේ පැමිණිල්ලක් සිදු කරනු ලැබ ඇත.

26) මුල් අවස්ථාවේදී ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩුකරය එකී කොමිෂන් සභාවේ විමර්ශණ සිදුවෙමින් පවතින බැවින් නවතාලන ලෙසට වූදිතයන් විසින් කරනු ලැබූ ඉල්ලීම ගරු නීතිපතිවරයා විසින් ගරු ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ ප්‍රතික්ෂේප කොට ඇති අතරම එහිදී ගරු පූර්ව නීතිපතිවරයාගේ ස්ථාවරය වුයේ ගරු ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේ විභාග වන නඩුකරයකට කිසි සේත් එවැනි කොමිෂන් සභාවක් බලපෑම් කළ නොහැකි බවයි. ඒ අනුව එම නඩුකරය වූදිතයන් සම්බන්ධයෙන් මේවන විටත් ගරු ත්‍රිපුද්ගල මහාධිකරණයේ ක්‍රියාත්මක වේ.

27) තවද ඉහත සඳහන් ජනාධිපති කොමිෂන් සභාව වර්ෂ 2015 පසු දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් විමර්ශණ කිරීම සඳහා ආරම්භ කරන ලද කොමිෂන් සභාවක් වන අතර මෙකී අපරාධය සිදුවූයේ 2008 - 2009 කාලවකවානුවලදී වන අතර මේ සම්බන්ධයෙන් අධිකරණ කටයුතු ආරම්භ වූයේ, 14 වන වූදිතයාට

එරෙහිව චෝදනා සම්බන්ධව කරුණු අනාවරණය වූයේ 2015 වර්ෂයට පෙරය. එබැවින් 14 වන වූදිතයා විසින් කිසියම් ආකාරයකට මෙම අධිචෝදනා පත්‍රය ඉවත් කරවා ගැනීම සඳහා එකී කොමිෂන් සභාවේ නිර්දේශයන් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත්කොට ඇත්තේ නම් මෙකී නඩුකරයට විශේෂිත කරුණක් ලෙස අදාළ කරගත නොහැක. තවද ඉහතකී දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශණය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශයන්ට එරෙහිව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ගණනාවක් ගොනුවූ අතර එකී කොමිෂම ලබාදුන් තීරණ නීති විරෝධී බවට ප්‍රකාශකොටද ඇත.

28) සාක්ෂි කරුවන්ගේ සහ ඔවුන් මගින් අනාවරණය කරගනු ලැබූ කරුණු මත 14 වන වූදිතයා වන වසන්ත කරන්නාගොඩ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව නගා ඇති අධිචෝදනා විභාග කළ හැක්කේ සාධාරණ නඩු විභාගයකදී එකී සාක්ෂි හබ කිරීමෙන් පමණක් බව අගතියට පත් පාර්ශවයේ ස්ථාවරය වේ.

29) එබැවින් ඉහත කී 14 වන වූදිතයාගේ අධිචෝදනා පත්‍රය ඉවත්කර ගැනීමට කරනු ලබන උත්සහය සහ නීතිපතිවරයා සිය ව්‍යවස්ථානුකූලව ලබාදී ඇති බලය අනිසි ලෙස යොදා ගනිමින්, ඊට එකගව ක්‍රියා කිරීම වින්දිත පාර්ශවයන්ගේ යුක්තිය ඉෂ්ඨ කර ගැනීමේ අරමුණුවලට හා ඔහුන්ගේ මූලික අයිතිවාසිකම්වලට අගතිදායක වන අතර එය අගතියට පත් පාර්ශවය විසින් දීර්ඝ කාලයක් පුරා අධිකරණ ක්‍රියාවලියක් යටතේ යුක්තිය ඉෂ්ඨ කර ගැනීමට අරමුණු කරනු ලැබූ බලාපොරොත්තු අයුක්ති සහගත ලෙස ඛණ්ඩනය වීමකට හේතු වියහැකි සේම එය ස්වභාවික යුක්ති මූලධර්මයන්ට අයහපත් ලෙස බලපෑ හැක.

30) අදාළ සියළු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විශ්ලේෂණය කොට 5 දෙනෙකුට ආසන්න නීතිපතිවරුන් යටතේ විශේෂයෙන් මෙරට ගරු අගවිනිසුරුවරයා ලෙස කටයුතු කරන ජයන්ත ජයසූරිය මහතා නීතිපතිවරයා ලෙස දැරූ ස්ථාවරයද, ඉන් අනතුරුව පැමිණි තීතිපතිතුමා විසින් වසර 11ක විමර්ශණ වලින් පසු 14 වන චූදිතයාට එරෙහිව ගොනුකොට ඇති අධිචෝදනා පත්‍රය නීතියට අනුකූල වන බවත්, එය ඉවත් කරවා ගැනීම සඳහා ඉල්ලා සිටීමට 14 වන චූදිතයා වෙත කිසිදු ආකාරයේ සාධාරණ සහ යුක්ති සහගත හේතුවක් නොමැති බවයි.

31) චූදිතයකු වූ වසන්ත කරන්නාගොඩ වර්තමාන නීතිපති සංජය රාජරත්න වෙත යොමු කරන ලිඛිත සැලකිරීමක් රහස් ලිපියක් ලෙස ගෙන හා එම කරුණු මත මෙවැනි බරපතල අපරාධයක් සම්බන්ධයෙන් ඔහුට එරෙහිව පවතින අපරාධ අධිචෝදනාව ඉල්ලා අස්කර ගැනීමට නීතිපතිවරයා අත එසවීම මගින් අපගේ යුක්තිය ඉටුවීමට පයින් ගසා ඇතිවා සේම මෙකී අපරාධය සම්බන්ධයෙන් විමර්ශන කළ නිලධාරීන්, එකී විමර්ශන සම්බන්ධයෙන් වසර 11ක කාලයක් තුළ අධිකරණමය තීන්දු තීරණ ලබාදුන් මහේස්ත්‍රාත්වරුන් සහ එකම ස්ථාවරය දැරූ නීතිපතිවරුන් පස් දෙනෙකුට ආසන්න ප්‍රමාණයකගේ හා ඒ සම්බන්ධයෙන් පොදුවේ උපදෙස් ලබාදුන් රජයේ අධිනීතිඥවරුන් හට අපහාසයක් සිදුකොට අවමානයට, අවප්‍රමාණයට ලක්කොට ඇත. සියළු පාර්ශවයන්ට යුක්තිය සහ සාධාරණය ඉෂ්ඨ කිරීම සඳහා වන සාධාරණ නඩු විභාගයක් සඳහා සහ එකී සාධාරණ නඩු විභාගයෙන් පසු සාධාරණ ලෙස එළඹිය හැකි අනුමිතින්ට පූර්වේදීම එළඹීමට පොළඹවන ආකාරයේ 14 වන වූදිතයා කරනු ලබන පදනම් විරහිත අධිචෝදනා පත්‍රය ඉවත් කිරීම සම්බන්ධයෙන් දරන ස්ථාවරයට නීතිපතිවරයා අත එසවීම අතුරුදහන්කළ දරුවන්ගේ වයස්ගත දෙමාපියන් ලෙස අප පිළිකුලෙන් යුතුව ප්‍රශ්න කර සිටිමු. හෙළා දකිමු. එසේම මෙකී අපරාධය සිදුකර වසර 16ක් ගතව ඇති බවත්, තම ලෙයින් මසින් උපත ලද අහිංසක දරුවන් වෙනුවෙන් උන්හට

මව්කිරි පොවා ඇති දැඩි කළ දෙමාපියන් ලෙස අපි තවමත් මහ මග යුක්තිය සොයමින් සිටින බවද සිහිපත් කර සිටිමු.

අගතියටපත් අතුරුදහන්කළ දරුවන්ගේ මවුවරු

විමසීම්: 0766627739 ජෙනිෆර් වීරසිංහ මව

අගතියටපත් මවුවරු වෙනුවෙන් අතුරුදහන්වූවන්ගේ පවුල් එකතුව විසින් මෙය මුද්‍රණයකර බෙදා හරින ලදි.